සැ. යු. -   මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.10.14 දින පළ වූ අංක 1,728 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,729 - 2011 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා - 2011.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1644 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1648 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1651 |


සැ. යු. - (i) රංජිත් අලුවිහාරේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 අගෝස්තු මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිත් සෙවන මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මිනුවන්ගොඩ සිංහ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ඔක්තෝබර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. සෞඛ්‍ය කම්කරු | 01 | PL - 1-2006 (IV) රු. 11,730 -10x120 - 10x130 - 10x145-12x160-රු. 17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය (9 වසර)සමත් විය යුතු ය. |

(2) නියමිත තනතුර සඳහා වෙනත් පොදු සුදුසුකම් :

1. ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතු ය.
2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුයි. (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
3. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

(3) සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන අයදුම්කරුවන් සඳහාවන ලකුණු දීමේ නිර්ණායකයන් :

01. *මූලික අධ්‍යාපන සුදුසුකම් :*

| | | |
|---|---|---|
| 1-1 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ සාමාන්‍ය සාමාර්ථයක් සඳහා ලකුණු | 03 |
| 1-2 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා.පෙළ සම්මාන සාමාර්ථයක් සඳහා ලකුණු | 04 |
| 1-3 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සා.පෙළ විශිෂ්ඨ සාමාර්ථයක් සඳහා ලකුණු | 05 |

අ.පො.ස. සා. පෙළ විභාගයේ උපරිම වශයෙන් විෂයන් දෙකක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබාදිය හැකි උපරිම ලකුණු සංඛ්‍යාව | 30 |
| 02. | සාමාන්‍ය දැනීම හා අවබෝධය සඳහා ප්‍රශ්නාවලියක් මගින් තෝරාගත් ප්‍රශ්න 05කට දෙනු ලබන පිළිතුරු අනුව උපරිම ලකුණු | 50 |
| 03. | පෞරුෂය සඳහා ලකුණු | 20 |
| | මුළු ලකුණු | 100 |

(4) බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.
2. දැනටමත් මෙම සභාවේ අදාළ තනතුරුවල තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම් මත සේවයේ නියුක්ත වූවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
3. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2011.11.15 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(5) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

(6) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුනා එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;

(ඈ) මැතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
(ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය;

(6) මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ අතරතුර දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(7) අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ගල්ගමුව.

2011 සැප්තැම්බර් මස 29 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ .................................................................. තනතුරු සඳහා අයදුම්පත්‍රය***

1. (අ) මුලකුරු සමග නම :——————————,
2. (ආ)සම්පූර්ණ නම :——————————,
3. ලිපිනය :——————————,
4. උපන් දිනය : අවුරුද්ද :—————, මාසය :—————, දිනය :—————,
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————,
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————,
7. විවාහක/අවිවාහක බව :——————————,
8. ජාතිය :——————————,
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————————,
10. අධ්‍යාපන සුදුසුකම් :——————————,
11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————,
12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර :——————————,
එම පත්වීමේ ස්වභාවය: (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම ද යන වග)

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් සේවයේ මුදාහැරීමට එකඟ වන බවත්, දැනට -—————————— වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

——————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————————,

10-397

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

ඛකුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මුරකරු | 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) අනුව රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600. | අ.පො.ස (සා.පෙළ) විභාගය විෂයන් දෙකක් සමත්වීම (වෛකල්පිත විෂය හැර) |
| 02 | මාර්ග කම්කරු | 04 | -එම- | -එම- |
| 03 | පුස්තකාල සහායක | 01 | - එම- | -එම- |
| 04 | මාර්ග කම්කරු ( කොන්ත්‍රාත් පදනම මත) | 01 | ඉහත චක්‍රලේඛයට අනුව දෛනික ගෙවීම් | -එම- |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;

(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ කළ යුතු ය.);

(iii) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය;

(vi) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත අයෙකු විය යුතු ය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය .-* සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රථිපල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මුරකරු තනතුරු 01 ද, පුස්තකාල සහායක තනතුරු 01 ද, සහ මාර්ග කම්කරු 03 ද ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය ;

(ii) මාර්ග කම්කරු තනතුරු 01 (කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ) ;

(iii) ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ ;

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව 2008.11.19 වැනි දින ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2011 .................... හෝ එදිනට පෙර "ලේකම් කුලියාපිටිය ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කර."....................................... තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු යː-

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතිකය;
*(ඇ)* අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය;
(ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතු ය.)
*(ඉ)* මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික 02ක් ;
*(ඊ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික .

මෙම අයදුම්පත කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එච් ඒ. ජී. නිශ්ශංක,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 23 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
කුලියාපිටිය.

ආදර්ශ අයදුම් පත්‍රය

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන III ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම - 2011**

................................................ .තනතුර සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.
6. දිස්ත්‍රික්කය :——————————.
7. උපන් දිනය : අවුරුද්ද :——————————. මාසය :——————————. දිනය :——————————.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :——————————. මාස :——————————. දින :——————————.
9. ස්ත්‍රී /පුරුෂ භාවය :——————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————.
11. විවාහක/අවිවාහක ද යන වග :——————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
13. අධ්‍යාපන සුදුසුකම් ඃ
   අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ
   සමත් වර්ෂය හා විභාග අංකය :——————————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| *01.* | | |
| *02.* | | |
| *03.* | | |
| *04.* | | |
| *05.* | | |
| *06.* | | |
| *07.* | | |
| *08.* | | |

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————.
15. සේවා පළපුරුද්ද :
   *(අ)* දැනට සේවය කරන ආයතනය :——————————.
   *(ආ)* දැනට දරන තනතුර :——————————.
   *(ඇ)* එම තනතුරට පත්වූ දිනය:——————————.
   *(ඈ)* මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයෙන් පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන................................................ මයා/මිය/මෙනවිය, දැනට මෙම ආයතනයේ ................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ හෝ බලය
පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
ආයතනය :——————————.
දිනය :——————————.

10-384

# පළාත් පාලන නිවේදන

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24 (2) වැනි වගන්ති යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර, සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත්, අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. දිනේෂ් ගුණරත්න,<br>
සභාපති,<br>
අරණායක ප්‍රාදේශීය සභාව.

2011 සැප්තැම්බර් මස 27 වැනි දින,<br>
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

*මාර්ගයේ නම* : කාරියගම පාරේ සිට උණපදුරමුලහේන දක්වා මාර්ගය<br>
*මාර්ගයේ ආරම්භය හා අවසානය* : කාරියගම පාරෙන් ආරම්භව උණපදුරමුලහේන ඉඩම දක්වා

*ග්‍රාම නිලධාරි වසම* : කාරියගම<br>
*මාර්ගයේ දිග* : මීටර් 92, *මාර්ගයේ පළල* : අඩි 10

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. පී. එම්. ජී. හින්නිමහත්තයා මයා | පෙතිබෝගොඩවත්ත |
| 2. යූ. ජී.පාලිත රංජිත් මයා | උණපදුරමුලහේන |
| 3. යූ, ජී. එම්. මැණිකේ මිය | උණපදුරමුලහේන |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :

| | |
|---|---|
| 1. යූ. ජී. හේරත් බණ්ඩා මයා | උණපදුරමුලහේන |
| 2. යූ, ජී. එම්. මැණිකේ මිය | උණපදුරමුලහේන |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2011.06.04 දිනැති අංක 7452 දරන පිඹුරුපත පරිදියි.

*මාර්ගයේ නම* : දිප්පිටිය හෙම්මාතගම මාර්ගයේ පනපුරවත්ත සිට සුසානභූමිය දක්වා මාර්ගය<br>
*මාර්ගයේ ආරම්භය හා අවසානය* : දිප්පිටිය හෙම්මාතගම මාර්ගයේ පනපුරවත්ත සිට සුසානභූමිය දක්වා මාර්ගය

*ග්‍රාම නිලධාරි වසම* : අංක 44/සී තල්ගස්පිටිය මුස්ලිම්ගම වසම<br>
*මාර්ගයේ දිග* : මීටර් 165 *මාර්ගයේ පළල* : අඩි 08

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. එම්. අයි. යූ. පායිස් මයා | පනපුරේ මූකලාන |
| 2. ඕ. එල්. එම්. මර්සූක් මයා | පනපුරේ මූකලාන |
| 3. එස්. එල්. එම්. රිස්මි මිය | පනපුරේ මහකුඹුර වෙල |
| 4. පනපුර පල්ලියට අයත් සුසානභූමිය පිහිටි ඉඩම | |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. එම්. ඒ. පාතිමා මිය | පනපුරේ මූකලාන |

| | |
|---|---|
| 2. එස්. එල්. එම්. රිස්මි මිය | පනපුරේ මහ කුඹුර වෙල |
| 3. ඒ. ආර්. එම්. සෙයිනුදීන් මයා | පනපුරේ මහ කුඹුර වෙල |
| 4. පනපුර පල්ලියට අයත් සුසානභූමිය පිහිටි ඉඩම | |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2011.07.16 දිනැති අංක 7547 දරන පිඹුරුපත පරිදියි.

*මාර්ගයේ නම :* තම්මිට දෙනියවත්ත මාර්ගය
*මාර්ගයේ ආරම්භය හා අවසානය :* තම්මිට පාළම අසල සිට එම්. ආර්. සමරකෝන් බණ්ඩා මහතාට අයත් වඩුගොඩතැන්න වත්ත දක්වා.

*ග්‍රාම නිලධාරී වසම* : අංක 17/ඩී ගම්මන්නාගොඩ වසම
*මාර්ගයේ දුර* : මීටර් 95 *මාර්ගයේ පළල :* අඩි 08

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. ඒ. ආර්. ජයසේකර මයා | පන්සල්වත්ත |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. ඩබ්. එම්. බී. කේ. කේ. වර්ෂකෝන් මයා | වඩුගොඩතැන්න වත්ත |
| 2. වී. ආර්. සමරකෝන් බණ්ඩා මයා | වඩුගොඩතැන්න වත්ත |
| 3. යූ. ආර්. සමරකෝන් බණ්ඩා මයා | වඩුගොඩතැන්න වත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2011.07.15 වැනි දින අංක 7546 දරන පිඹුරුපත පරිදියි.

*මාර්ගයේ නම :* උඩුවේවල මැදවල සිට උඩහවත්ත මාර්ගය
*මාර්ගයේ ආරම්භය හා අවසානය :* කන්දවත්ත සිට යාලපල මාර්ගයේ එපිටවත්ත සහ පන්සලේවත්ත ඉඩම අසලින් ආරම්භව ඉහලවත්තේහේන ඉඩමෙන් අවසන් වෙයි.

*ග්‍රාම නිලධාරී වසම* : උඩුවේවල
*මාර්ගයේ දුර* : මීටර් 505 *මාර්ගයේ පළල :* අඩි 10

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. ආර්. ඒ. රාජපක්ෂ මිය | උඩගෙදර වත්ත |
| 2. එම්. විජේලතා මිය | උඩගෙදර වත්ත |
| 3. එම්. කරුණානන්ද මයා | පොල්ගස්දෙනිය හේන |
| 4. එම්. රණසිංහ මයා | පොල්ගස්දෙනිය හේන |
| 5. එම්. ලයනල් වීරසිංහ මයා | හේවාපේඩිගේ හේන |
| 6. ගාමිණී ඇතුගල මයා | හේවාපේඩිගේ හේන |
| 7. එච්. ධර්මසිරි මයා | ඉහලවත්තේ හේන |
| 8. එච්. සෝමපාල මයා | ඉහලවත්තේ හේන |
| 9. එච්. රත්නපාල මයා | ඉහලවත්තේ හේන |

මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :-

| | |
|---|---|
| 1. ආර්. ඒ. රාජපක්ෂ මිය | එපිටවත්ත |
| 2. ඊ. සෝමපාල මයා | කම්මලවත්ත |
| 3. එම්. රණසිංහ මයා | පොල්ගස්දෙනියහේන |
| 4. එම්. ලයනල් වීරසිංහ මයා | පොල්ගස්දෙනියහේන |
| 5. එච්. ගුණරත්න මයා | ඉහලවත්තේහේන |
| 6. එච්. සෝමරත්න මයා | හේවාපේඩිගේ හේන |
| 7. එච්. සෝමපාල මයා | ඉහලවත්ත හේන |
| 8. එච්. සාලුක ගුණරත්න මයා | උඩහවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතාගේ 2007.08.15 දිනැති අංක 4832 දරන පිඹුරුපත පරිදියි.

10-396

**මහනුවර මහ නගර සභාව**

2011 පරිපූරක අය වැය ලේඛනය - 01

මහ නගර සභා ආඥා පනතේ 214 2(ආ) වගන්තිය ප්‍රකාරව 2011 මුදල් වර්ෂය සඳහා වූ මහනුවර මහ නගර සභාවේ පරිපූරක අංක 01 අයවැය 2011 ඔක්තෝබර් මස 21 වැනි දින සිට දින හතක (07) ක කාලයක් මහජනතාවට පරීක්ෂාකර බැලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි අතිවිශේෂ ගැසට් අංක 1718/07 හා 2011.08.08 දිනැති ගැසට් නිවේදනය මගින් මහනුවර මහ නගර සභාවේ පරිපාලන කටයුතු කිරීම හා එම කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා බලය පැවරී ඇති පළාත් පාලන කොමසාරිස් (මධ්‍යම පළාත) ඩබ්. එම්. වික්‍රමරත්න වන මා විසින් පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මහනුවර නාගරික කොමසාරිස් කාර්යාලය
2. ප්‍රධාන නාගරික ගණකාධිකාරි කාර්යාලය, මහ නගර සභාව, මහනුවර
3. ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, මහනුවර

ඩබ්. එම්. වික්‍රමරත්න,
පළාත් පාලන කොමසාරිස්,
(මධ්‍යම පළාත) හා මහනුවර
මහ නගර සභාවේ පරිපාලන
කටයුතු පිළිබඳ බලයලත් නිලධාරි.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-420/2

**මහනුවර මහ නගර සභාව**

අය වැය ලේඛනය - 2012

මහ නගර සභා ආඥාපනතේ 212(ආ) වගන්තිය ප්‍රකාරව 2012 මුදල් වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 2011 ඔක්තෝබර් මස 21 වැනි දින සිට දින හතක (07) ක කාලයක් මහජනයාට පරීක්ෂා කර බැලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි අති විශෙෂ ගැසට් අංක 1718/07 හා 2011.08.08 දිනැති ගැසට් නිවේදනය මගින් මහනුවර මහ නගර සභාවේ පරිපාලන කටයුතු කිරීම හා එම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලය පැවරී ඇති පළාත් පාලන කොමසාරිස් (මධ්‍යම පළාත) ඩබ්. එම්. වික්‍රමරත්න වන මා විසින් පහත සඳහන් ස්ථානවල තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මහනුවර නාගරික කොමසාරිස් කාර්යාලය
2. ප්‍රධාන නාගරික ගණකාධිකාරි කාර්යාලය, මහ නගර සභාව, මහනුවර
3. ඩී. එස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය, මහනුවර

ඩබ්. එම්. වික්‍රමරත්න,
පළාත් පාලන කොමසාරිස්,
(මධ්‍යම පළාත) හා මහනුවර
මහ නගර සභාවේ පරිපාලන
කටයුතු පිළිබඳ බලයලත් නිලධාරි.

2011 සැප්තැම්බර් මස 30 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-420/1

---

**මොරටුව මහ නගර සභාව**

2012 වර්ෂයට වරිපනම් බදු පැනවීම

(252 වැනි අධිකාරිය) මහ නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තිය ප්‍රකාර මොරටුව මහ නගර සභාව විසින් කරනු ලැබිය හැකි සීමා කිරීම් කොන්දේසි සහ නිදහස් කිරීම්වලට යටත්ව මොරටුව මහ නගර සභාවේ පරිපාලනය භාර ප්‍රාදේශීය ලේකම්ගේ අංක 49 හා 2011.09.14 දිනැති තීරණය පරිදි මොරටුව මහ නගර සභා බල ප්‍රදේශ සීමාව තුළ පිහිටි සියලුම දේපළවලින් 2011 වර්ෂයේ පවතින වාර්ෂික තක්සේරුව 2012 වර්ෂයට ද, එලෙසින්ම පවත්වා ගනිමින් එකී වාර්ෂික තක්සේරුව මත පදනම්ව පහත සඳහන් ප්‍රතිශතයන් මත 2012 වර්ෂයට වරිපනම් බදු අයකර ගැනීමටත්,

*(අ)* සියලුම පදිංචි වාසස්ථානවලින් වාර්ෂික තක්සේරු වටිනාකමෙන් 8% ක වරිපනම් බද්දක් ද,

*(ආ)* පදිංචි වාසස්ථාන නොවන අනෙකුත් සියලුම වාණිජ, කර්මාන්ත, රජයේ දේපළ, සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල ආදී දේපළවලින් තක්සේරු වටිනාකමින් 12%ක වරිපනම් බද්දක් ද,

*(ඇ)* සියලුම මුඩුබිම් (හිස් ඉඩම්) හා පදිංචි නොමැති තනාගෙන යන ගොඩනැගිලිවල වාර්ෂික තක්සේරු වටිනාකමින් 20%ක වරිපනම් බද්දක් ද,

2012 වර්ෂය වෙනුවෙන් මොරටුව මහ නගර සභාව විසින් පනවා අයකරනු ලබන බවත්, එකී බදු මුදල් පිළිවෙලින් 2012 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්හි දී හෝ ඊට පෙර සමාන කොටස් හතරකින් හෝ සම්පූර්ණයෙන් ගෙවිය යුතු බවත්,

2. මහ නගර සභා ආඥාපනතේ 230(4) වගන්තිය ප්‍රකාර ඉහත සඳහන් වාර්ෂික බදු මුදල් පහත සඳහන් පරිදි ගෙවූ විට,

*(අ)* 2012 ජනවාරි 31 වැනි දින පස්වරු 3.00ට හෝ ඊට ප්‍රථම මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු මුදල් එකවර ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 10%ක් ද,

*(ආ)* එම මුදල් කාර්තු වශයෙන් ගෙවන විට වරිපනම් බදු ගෙවිය යුතු අදාළ කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් 5%ක් වට්ටම් වශයෙන් අඩුකරනු ලබන බවද ඉහත කී පළමු ඡේදයේ ප්‍රකාර නියමිත කාලසීමාව ඇතුලත ගෙවිය යුතු

බදු මුදල් නොගෙවා පැහැර හරින අයගෙන් සෑම පදිංචි වාසස්ථානයක් සඳහා ගෙවිය යුතු වරිපනම් බදු මුදලින් 15% ක් හා සෑම වාණිජ කර්මාන්ත රජයේ සංස්ථා මුඩු ඉඩම් සහ අනෙකුත් ස්ථාන සඳහා ගෙවිය යුතු වරිපනම් බදු මුදලින් 20%ක වරෙන්තු ගාස්තුවක් අදාළ සෑම කාර්තුවක් සඳහා අයකරනු ලබන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

යූ. ඩී. සී. ප්‍රනාන්දු,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2011 ඔක්තෝබර් මස 05 වැනි දින,
මොරටුව මහ නගර සභා කාර්යාලයේ දී ය.

10-461

---

# විවිධ දැන්වීම්

## අම්පාර නගර සභාව

### බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු - 2012 වර්ෂය

2012 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු හා වෙළෙඳ බදු පැනවීම

1979 අංක 42 දරන මහ නගර සභා හා නගර සභා (සංශෝධිත) පනතේ වැඩි දුරටත් සංශෝධිත 1985 අංක 20 දරන මහ නගර සභා (සංශෝධිත) පනතේ වැඩි දුරටත් (සංශෝධිත) නගර සභා ආඥා පනතේ (255 වැනි අධිකාරිය) 164, 165(අ), 165(ආ), 165අ.අ, 165ඇ යන වගන්තිවලට යටත්ව අම්පාර නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් උපලේඛනවල විස්තර කර ඇති වෙළඳ ව්‍යාපාර වෙනුවෙන් එහි දක්වා ඇති ආකාරයට බලපත්‍ර ගාස්තු හා බදු එකී දේපළ හෝ පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව උපලේඛනයේ සඳහන් පරිදි බද්දක් හෝ බලපත්‍ර ගාස්තුවක් 2012 වර්ෂයට ක්‍රියාත්මක වන පරිදි පනවා අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු හා බදු එම වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බව වැඩි දුරටත් මෙයින් නිවේදනය කරමි.

ඉන්දික නලින් ජයවික්‍රම,
සභාපති,
අම්පාර නගර සභාව.

2011 සැප්තැම්බර් මස 21 වැනි දින,
අම්පාර නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය 01*

*164 හා 165 අ. අ වගන්තිවලට යටත්ව පනවන ලද බලපත්‍ර ගාස්තු*

| | *වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු.2,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.2,500 සිට රු.5,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.5,000 සිට රු.7,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.7,500 සිට රු.10,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.10,000ට වැඩි* |
|---|---|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 | 1,000 0 | 1,000 0 |
| 02. | බත් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 03. | තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 200 0 | 400 0 | 600 0 | 800 0 | 1,000 0 |
| 04. | භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 05. | තේ, කෝපි කඩ හා භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 06. | ලැගුම් හලක් (නවාතැන් පොළක්) පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 07. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 650 0 | 850 0 | 1,000 0 |
| 08. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 09. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 10. | ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | හෝටලයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 12. | එළවළු වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 600 0 | 800 0 |
| 13. | පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 600 0 | 800 0 |
| 14. | අයිස්ක්‍රීම්, යෝගට් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 15. | කිරි එකතු කිරීමේ හා කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 16. | කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 500 0 | 600 0 |
| 17. | බීම වර්ග, රසකැවිලි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 550 0 | 700 0 | 900 0 |
| 18. | මීකිරි, පස්ගෝ රස නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |

| *වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු.2,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.2,500 සිට රු.5,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.5,000 සිට රු.7,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.7,500 සිට රු.10,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.10,000ට වැඩි* |
|---|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| *අන්තරාදායක ව්‍යාපාර:* | | | | | |
| 01. කබොක්, බොරළු ගල්, ගඩොල් හෝ කළුගල් කැණීම, ගබඩා කිරීම හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 02. සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 850 0 | 1,000 0 |
| 03. ග්‍රෝස් එකට වැඩි ප්‍රමාණයක් සිසිල්බීම ගබඩා කර තිබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 04. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 05. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 06. ග්‍රෝස් 10ට වැඩි ප්‍රමාණයක් ගිනි පෙට්ටි ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 07. ඇසිඩ් වර්ග හා ස්ප්‍රීතු වර්ග ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 08. උළු විකිණීම හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 09. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 350 0 | 550 0 | 700 0 | 900 0 |
| 10. පාවිච්චි කළ ඇඳුම් ගබඩාකර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 11. ධාන්‍ය හෝ මාංශ භෝග හොණ්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 12. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 13. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 14. දැව විකිණීම හා දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 15. දර විකිණීම හා දර ගබඩාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 16. කම්හලක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 800 0 |
| 17. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 18. හිස් බෝතල් හෝ හිස් ගෝනි විකිණීම හා ගබඩා කර තබා ගැනීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 19. මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම හා වැඩපොළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 20. අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් විකිණීම හා ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 21. පාවිච්චි කරන ලද කඩදාසි හෝ කඩදාසි ගබඩා කර තැබීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 22. විසිරි පින්තාරු කිරීම හා (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 23. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 24. පා පැදි අමතර කොටස් අලෙවි කරන හෝ පා පැදි අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 25. සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 26. යතුරු පැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| *අප්‍රසන්න ව්‍යාපාර :* | | | | | |
| 01. පොහොර හෝ රසායන පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 02. කුකුළන් හා කිකිළියන් 100ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 750 0 | 850 0 |
| 03. බැටළුවන්, ඌරන්, එළුවන් හා එළ ගවයින් 25කට වැඩි ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |

| | *වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු.2,500 දක්වා* | *වාර්ෂික වටිනකාම රු.2,500 සිට රු.5,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.5,000 සිට රු.7,500 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.7,500 සිට රු.10,000 දක්වා* | *වාර්ෂික වටිනාකම රු.10,000ට වැඩි* |
|---|---|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 04. | පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 05. | තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 06. | කරවල, ලුණු මාළු, ජාඩි, හොණ්ඩර 3ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 07. | සිමෙන්ති හොණ්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 08. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තැබීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 09. | සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 10. | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය එකතු කිරීම හා ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 11. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කර තැබීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 12. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 13. | සිරප් හෝ පළතුරු බීම වර්ග සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 14. | රසකැවිලි වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 | 650 0 | 800 0 |
| 15. | හුණුගල් හෝ හුණු ගබඩා කර තැබීම හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 | 650 0 | 800 0 |
| 16. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් ගබඩා කර තැබීම හා විකිණීම | 400 0 | 350 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 17. | යන්ත්‍රානුසාරයෙන් කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග, කුළු බඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 18. | ඉටිපන්දම් නිපදවීම හා විකිණීම හා ගබඩා කර තැබීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 19. | ටයර් හෝ ටියුබ් වොල්කනයිසින් කිරීම හා ටයර් වැඩ පොළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 20. | කළු ගල් අඹරන (මෙටල් ක්‍රෂර්) මධ්‍යස්ථානයක් හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 21. | පොල් තෙල් මෝලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 22. | ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 23. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 24. | උම්බලකඩ නිෂ්පාදනය හා ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 25. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ එම භාණ්ඩ ගබඩා කිරීම හෝ විකිණීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| | *අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර* : | | | | | |
| 01. | විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 850 0 |
| 02. | ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 03. | බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 04. | වැල්ඩින් වැඩ පොළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 05. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 06. | වාත්තු වැඩ පොළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 07. | පැට්‍රල්, ඩීසල්, භූමිතෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 08. | ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 09. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 10. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 11. | වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 12. | විදුලි කර්මාන්ත වැඩපොළක් හෝ කැසට් රේඩියෝ, රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 13. | යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් වඩු වැඩ පොළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |

| | වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර | වාර්ෂික වටිනාකම රු.2,500 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනකාම රු.2,500 සිට රු.5,000 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු.5,000 සිට රු.7,500 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු.7,500 සිට රු.10,000 දක්වා<br>රු. ශත | වාර්ෂික වටිනාකම රු.10,000ට වැඩි<br>රු. ශත |
|---|---|---|---|---|---|---|

*උපලේඛනය 02*

*165 අ හා 165 අ.අ වගන්තිවලට යටත්ව පනවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු (255 වැනි අධිකාරය)*

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. | මෝටර් වාහන කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 02. | වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 03. | විදුලි උපකරණ, ගුවන් විදුලි යන්ත්‍ර, කැසට්, රූපවාහිනී යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 04. | බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 05. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 350 0 | 450 0 | 600 0 | 800 0 | 1,000 0 |
| 06. | පාපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 07. | පාවහන් හා බෑග් වර්ග වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 08. | කැසට් පටි, වීඩියෝ පටි, වීඩියෝ තැටිගත කරන හා අලෙවි කරන ස්ථානයක් හෝ කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 09. | මහන මැෂින් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 10. | පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 11. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 850 0 | 1,000 0 |
| 12. | දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 13. | දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 850 0 | 1,000 0 |
| 14. | විසිතුරු බඩු හා සාප්පු බඩු වෙළඳාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 15. | නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 16. | රෙදි පිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 17. | ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 800 0 | 1,000 0 |
| 18. | සිසිල් බීම වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 19. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 20. | ලියාපදිංචි කළ පෞද්ගලික තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 650 0 | 800 0 | 1,000 0 |
| 21. | ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 22. | නාන කාමර කට්ටල් හෝ සෙරමික් නිෂ්පාදන භාණ්ඩ හා උළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 23. | පුවත්පත්, ලිපි ද්‍රව්‍ය, පාසල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 24. | වතුර පොම්ප විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 25. | පොත් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 600 0 | 800 0 | 1,000 0 |
| 26. | බිත්තර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 600 0 | 800 0 | 1,000 0 |
| 27. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 28. | මෝටර් හෝ කොම්පියුටර් ප්‍රින්ටින්, ස්ක්‍රීන් ප්‍රින්ටින් ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 29. | පොලිතින්, ප්ලාස්ටික්, රබර් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 30. | මංගල ශාලාවක් හෝ උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 31. | සැලසුම් නිර්මාණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 32. | වාහන බැටරි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 33. | කුෂන් වැඩපොලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 34. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 35. | පොල් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 36. | සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 37. | කුළුබඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 350 0 | 450 0 | 600 0 | 800 0 | 1,000 0 |
| 38. | පරිගණක හෝ යතුරුලියන පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |

| | වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර | වාර්ෂික වටිනාකම රු.2,500 දක්වා | වාර්ෂික වටිනකාම රු.2,500 සිට රු.5,000 දක්වා | වාර්ෂික වටිනාකම රු.5,000 සිට රු.7,500 දක්වා | වාර්ෂික වටිනාකම රු.7,500 සිට රු.10,000 දක්වා | වාර්ෂික වටිනාකම රු.10,000ට වැඩි |
|---|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 39. | එල්. පී. ගෑස් අලෙවි නියෝජිත හෝ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 40. | එළවළු බීජ වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 800 0 |
| 41. | ඡායාරූප වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 42. | මැටි වළං දේශීය නිෂ්පාදන විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 800 0 |
| 43. | පිඟන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 44. | අවමංගල භාණ්ඩ, උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 45. | මිනී පෙට්ටි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 46. | බුලත්, පුවක්, දුම්කොළ, සුරුට්ටු ආදිය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 | 700 0 | 900 0 |
| 47. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 48. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 49. | බටහිර ඖෂධ වෙළඳසැලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 50. | ආයුර්වේද ඖෂධ වෙළඳසැලක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 51. | තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 52. | ජ්‍යොතිෂ්‍ය කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 650 0 | 800 0 | 1,000 0 |
| 53. | සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 54. | කුළුබඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 550 0 | 750 0 | 900 0 |
| 55. | මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 56. | සනීපාරක්ෂක උපකරණ කට්ටල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 57. | සුරතල් සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 600 0 | 800 0 |
| 58. | විකිණීම සඳහා මල් පැල හෝ පැල තවානක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 | 550 0 | 750 0 |
| 59. | මෙට්ට නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 60. | ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 61. | වානේ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 62. | රජය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 63. | කිරි එකතු කිරීමේ හෝ කිරි ශීත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 64. | පරිගණක හා ඒ ආශ්‍රිත සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 65. | ගෘහ භාණ්ඩ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 550 0 | 700 0 | 900 0 |
| 66. | දුරකථන සේවා, ෆැක්ස් සේවා, අන්තර් ජාල පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 67. | ප්ලාස්ටික්, ෆයිබර් ආශ්‍රිත වැඩපොළක් හෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 68. | ආයුර්වේද දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම නිස්සාරණය කිරීම හෝ සංයෝජනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 | 700 0 | 900 0 |
| 69. | ලොරි බොඩි සාදන සථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 70. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 71. | ඇඳුම් පිරිසිදු කිරීමේ ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 800 0 |
| 72. | කඩදාසි බෑග් නිෂ්පාදනය හා ගබඩා කිරීම | 200 0 | 300 0 | 400 0 | 550 0 | 800 0 |
| 73. | අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 450 0 | 650 0 | 800 0 |
| 74. | කාය වර්ධන මධ්‍යස්ථාන | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 75. | බිම්මල් නිෂ්පාදනය | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |
| 76. | පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි දැන්වීම් භාර ගැනීම හා ගුවන් විදුලි, රූපවාහිනී වැඩ සටහන් සෑදීම | 400 0 | 600 0 | 800 0 | 1,000 0 | 1,000 0 |

*උපලේඛනය 03*

*නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 165 ආ වගන්තිය යටතේ පනවන බදු*

මෙම බද්ද ගෙවිය යුතු වර්ෂයට ඉහතින් වූ වර්ෂයේ ව්‍යාපාරයේ ලැබීම්වලට අනුකූලව හා පහත දැක්වෙන ප්‍රමාණයන් නොඉක්මවන පරිදි වේ:

| *වර්ෂයේ වාර්ෂික ලැබීම්* | *ගෙවිය යුතු බද්ද රු. ශත* |
|---|---|
| 01. රුපියල් 6,000 නොඉක්මවන විට | නැත |
| 02. රුපියල් 6,000 ඉක්මවූත් රු. 12,000 නොඉක්මවන විට | 90.00 |
| 03. රුපියල් 12,000 ඉක්මවූත් රු. 18,750 නොඉක්මවන විට | 180.00 |
| 04. රුපියල් 18,750 ඉක්මවූත් රු. 75,000 නොඉක්මවන විට | 360.00 |
| 05. රුපියල් 75,000 ඉක්මවූත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| 06. රුපියල් 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

*ඉහත සඳහන් බදු ගාස්තු අදාල ව්‍යාපාර* :

01. වෙන්දේසිකරුවන්,
02. බ්‍රෝකර්වරුන්,
03. රක්ෂණ ආයතනයන්,
04. බැංකු කටයුතු හා මූල්‍ය ආයතන,
05. කොන්ත්‍රාත්කරුවන්,
06. විදේශ රැකියා ආයතන,
07. සිගරට් වෙළඳ නියෝජිත,
08. පුද්ගලික සාත්තු නිවාස,
09. දුරකථන අලෙවි සැලක්,
10. පෞද්ගලික විගණකාධිකාරි ආයතනයක්,
11. අපනයන හා ආනයන ඒජන්තවරු,
12. නීතිඥවරුන්,
13. වෛද්‍යවරුන්,
14. සැපයුම්කරුවන්,
15. ෆිනෑන්ස් ආයතන,
16. ප්‍රවාහන නියෝජිතයින්,
17. දෘෂ්ටි පරීක්ෂකයින් හා ඇස් කණ්නාඩි අලෙවිය,
18. ආහාරපාන සපයන්නෝ,
19. බලවේග පේෂකර්මාන්ත,
20. බතික් කර්මාන්ත,
21. බලයලත් උකස් ආයතන,
22. බලපත්‍ර ලාභී මත්පැන් හල්,
23. මෝටර් රථ වාහන වෙළඳාම් කරන්නවුන්,
24. රියදුරු පුහුණු කරන ආයතන,
25. යතුරු පැදි හා අත් ට්‍රැක්ටර්, ත්‍රීරෝද රථ වෙළඳාම් කරන්නන්,
26. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ආයතන,
27. පෞද්ගලික අධ්‍යාපන ආයතන හා ළදරු පාසල් පවත්වාගෙන යන්නන්,
28. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ඇඟලුම් කර්මාන්ත ශාලා හිමියන්, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කළ යම් හෝටලයක්, ආපනශාලාවක්,
29. නවාතැන් පොළක් පවත්වාගෙන යන්නන්.

ඉහත සඳහන් ගාස්තු සමග දැනට පවතින හෝ ශ්‍රී ලංකා ජනරජය තීරණය කර පනවන ලද බද්දක් මේ සමග ගෙවිය යුතු වේ.

මෙම බදු මුදල් ගෙවීමට අපොහොසත් වන අයට විරුද්ධව නගර සභා ආඥාපනතේ 152(2) වගන්තියට යටත්ව මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරන බව ගරු අධිකරණයට වාර්තා කර බදු මුදල සමග මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදුවන බව මෙයින් ප්‍රසිද්ධ කරමි.

10-385

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.